(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2107/20 - 2019 ජනවාරි මස 22 වැනි අඟහරුවාදා - 2019.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය :* GM/DS/HW/2015/2/2/1/133.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* 4-3/8/2016/HA/218.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පරකන්දෙණිය ගමේ, අංක 244 බී, පරකණ්දෙණිය උතුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් 2018.11.14 දිනැතිව පිළියෙල කරන ලද අංක මු.පි.ගම්.අංක 4109, කැබලි අංක 1 හි බිම් ප්‍රමාණයෙන් හෙක්ටර් 0.0152 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස:

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: මිල්ලගහලන්ද; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය:ඒ.ඩී.කේ.ධර්මසිරි, අංක 262, පරකන්දෙණිය, ඉඹුල්ගොඩ; ප්‍රමාණය:හෙක්. 0.0152.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2019 මැයි මස 08 වැනි දින පෙ.ව. 10.00ට ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2019 අප්‍රේල් මස 29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ.ඒ.එස්.ලක්ශ්‍රීණි ගුණතිලක,
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරී,
ගම්පහ.

2019 ජනවාරි මස 18 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ගම්පහ.

02- 240